# BELIEVERS EASTERN CHURCH

World Church Headquarters, St Thomas Community
Thiruvalla - 689 103, Kerala, India

## SHEPHERD'S LETTER

2026 මැයි - ජූනි

**ලොව පුරා විසිරී තිබෙන ශුද්ධ වූ සභාවේ මාගේ ප්‍රේමණීය එඬේරුන් සහ සියලු විශ්වාසිකයිනි,**

**අපගේ ස්වාමීන් සහ ගැළවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අනුග්‍රහයත්, කරුණාවත්, සාමයත් ඔබ සමග වේවා!**

**ක්‍රිස්තුන් වහන්සේ උත්ථාන වූ සේක!**

අපගේ සභාවේ ජනවන්දනා දින දර්ශනයට අනුව, අප දැන් සිටින්නේ අපගේ ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථාන සමයේය. අවට ලෝකය තුළ ඇති නොසන්සුන්තාවය සහ අවිනිශ්චිතතාවය අප අත්විඳිමින් සිටිය ද අපගේ ගැළවුම්කරුවාණන්ගේ උත්ථානය තුළ පවතින නොසැලෙන බලාපොරොත්තුව සහ ප්‍රීතිය තුළ ජීවත් වීමට අපව කැඳවා ඇත. එබැවින් අපට එක්ව මෙසේ පැවසිය හැකිය: ක්‍රිස්තුන් වහන්සේ උත්ථාන විය. ඔවුන් වහන්සේ ජීවමාන නිසා මට හෙට දවසට මුහුණ දිය හැකිය. නිර්භීතකමෙන් සහ ධෛර්යයෙන් යුතුව, උත්ථාන වූ

ක්‍රිස්තුන් වහන්සේ තම ගෝලයන් පිටත් කර හරිනු ලැබුවේ - පාස්කු මංගල්‍යයේ ප්‍රීතිය සහ අපගේ ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ බලාපොරොත්තුව අප අවට ලෝකයට පිළිබිඹු කිරීම උදෙසාය. තවද ජේසුස් වහන්සේ පොරොන්දු වූ පරිදි, ශුද්ධාත්මයාණන් වහන්සේ ගෝලයන් කෙරෙහි වැඩම කර, දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ පිළිබිඹුවක් වීමට ඔවුන්ව බලගන්වන සේක.

එබැවින්, 'පිටත් කර යවන ලද' අපෝස්තුළුවරු, පොළොවේ සීමා කෙළවර දක්වාම ඈතට පුළුල් ලෙස ගමන් කළහ. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ශක්තිය ලබා මුළු ලොව පුරා ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දරන්නට නික්ම ගිය අපෝස්තුළුවරුන් දොළොස් දෙනාට හට ගෞරව කිරීම පිණිස සභාව විසින් 'අපෝස්තුළුවරුන්ගේ චතාරිකය' ලෙසින් හඳුන්වන ශුද්ධ වූ කාල පරිච්ඡේදයක් වෙන් කර ඇත.

**මෙම චතාරිකය ආරම්භ වූයේ කෙසේද?** උතුම් වූ මෙහෙවර ක්‍රියාවට නැංවීමට පිටත්ව යාමට පෙර, ශුද්ධාත්මයාණන් වහන්සේගේ පොරොන්දුව ලැබෙන තෙක් රැඳී සිටින ලෙස ස්වාමි වූ ජේසුස් වහන්සේ අපෝස්තුළුවරුන්ගෙන් ඉල්ලා සිටි බව, අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි අපට දකින්නට ලැබෙයි. එමෙන්ම, සභාවේ ශුද්ධ වූ සම්ප්‍රදාය අපට පවසන්නේ, අපෝස්තුළුවරුන් තම ධර්මදූත කටයුතු සඳහා ඔවුන්ව සවිබල ගන්වන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලමින් චතාරිකයක් ආරම්භ කළ බවයි. පෙන්තකොස්ත දිනයේදී ශුද්ධාත්මයාණන් වහන්සේගේ පූර්ණත්වය ලබන තුරුම ඔවුන් මෙම චතාරිකය පවත්වාගෙන ගියහ.

එතැන් පටන් මේ දක්වා, සභාව 'අපෝස්තුළුවරුන්ගේ චතාරිකය' ලෙසින් පොදුවේ පිළිගනු ලැබූ මෙම උපවාස කාලය අනුගමනය කරයි. අපෝස්තුළුවරුන්ගේ චතාරිකය සෑම වසරකම ජූනි මස 16 වෙනි දින ආරම්භ වී ජූනි මස 28 වෙනි දින දක්වා පුරා දින 13 ක් පවතින අතර, ඉන් පසුව අපි මංගල්‍යයන් දෙකක් සමරන්නෙමු. එනම් ජූනි මස 29 වෙනි දින ශුද්ධ වූ පේදුරු සහ පාවුළු මුණිතුමන්ලාගේ මංගල්‍යය සහ ජූනි මස 30 වෙනි දින අපෝස්තුළුවරුන්ගේ මංගල්‍යයි.

අපි මෙම චතාරිකය අනුගමනය කරන්නේ කෙසේද? සභාවේ අනෙකුත් සියලුම චතාරික කාලසීමාවන් වලදී මෙන්, අපෝස්තුළුවරුන්ගේ චතාරිකයේදී ද දෙවියන් වහන්සේව වඩාත් කේන්ද්‍ර කරගනිමින්, විශ්වාසවන්ත ජීවිත ගත කිරීමේ අරමුණින් යාච්ඤාව, උපවාසය සහ දන්දීම කෙරෙහි අපගේ අවධානය යොමු කරන ලෙස අපට ඇරයුම් කරයි. නමුත් මෙම චතාරිකය සභාවේ අනෙකුත් චතාරිකයන්ගෙන් වෙනස් වන්නේ එය අපෝස්තුළුවරුන්ගේ මෙහෙවර අඛණ්ඩව කරගෙන යාමට අපට ඇරයුම් කරන බැවිනි. මාගේ දරුවෙනි, මුළු අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතම කියවා අවසන් කිරීම සඳහා මෙම ශුද්ධ වූ කාලය වෙන් කරන ලෙස මම ඔබව දිරිමත් කරන්නේ එබැවිනි. අපගේ ආශිර්වාදලත් මතකයට පාත්‍ර වූ මෝර්න් මෝර් ඇතනේසියස් පළමු යොහාන් මෙට්‍රොපොලිටන් පියාණන් නිතරම පැවසූ පරිදි, අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත ශුද්ධ වූ සභාවේ 'සැලැස්ම' වන අතර, අපෝස්තුළුවරුන්ගේ සේවය අවබෝධ කර ගැනීමටත්, ශුභාරංචිය බෙදාහදා ගැනීම සඳහා ඔවුන් තුළ තිබූ නොසැලෙන කැපවීම ගැන මෙනෙහි කිරීමටත් අපට ඇති ප්‍රධාන සම්පතයි. මෙම

හිතමතා නියම කරනු ලැබූ පිළිවෙත් තුළින්, අපෝස්තුළුවරුන්ගේ අඩිපාරේ ගමන් කිරීමට උත්සාහ කරමින්, ලොව පුරා ශුභාරංචිය පතුරුවා හැරීමේ කාර්යය දිගටම කරගෙන යාමට අපට ශක්තිය සහ බලය ලබා දෙන ලෙස අයදිමින් ස්වාමීන් වහන්සේට යාච්ඤා කරමු.

## අපෝස්තුළුවරුන්ගේ චතාරිකය අනුගමනය කිරීම උදෙසා ප්‍රායෝගික ක්‍රම තුනක්ඃ

**සේවයඃ** අපෝස්තුළුවරුන්ගේ චතාරිකය අපට ශුද්ධ වූ අපෝස්තුළුවරුන්ගේ ජීවිත සහ ආදර්ශයන් ගැන මෙනෙහි කිරීමට වාර්ෂිකව අවස්ථාවක් ලබා දෙනු ලබයි. නමුත් ඔවුන්ට ගෞරව කිරීමට ඔවුන්ව සිහිපත් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. අපෝස්තුළුවරුන් ආරම්භ කළ කාර්යය දිගටම පවත්වාගෙන යාම සහතික කිරීම තුළින් අපි ඔවුන්ගේ මතකයන්ට ගෞරවය දැක්විය යුතුය. ඔවුන්ගේ අනුගාමිකයන් සහ ආත්මික පරම්පරාව වන අපට උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ බලාපොරොත්තුව සහ ප්‍රීතිය අවට සිටින අය සමග බෙදා හදා ගැනීම භාර දී ඇත. එබැවින්, මෙම සමය තුළ දී, විශේෂයෙන්ම අපගේ සියලුම මීසම් සහ දියෝකීසි වල කරුණාවේ මෙහෙවර සහ දයානුකම්පාවේ සේවාවන් අඛණ්ඩව ඉටු කළ යුතුය.

**යාච්ඤාවඃ** එපීස 6:19-20 හි ශුද්ධ වූ පාවුළු තුමන් අපට මතක් කර දෙන පරිදි, අපගේ පූජකවරුන්ගේ සහ මිෂනාරිවරුන්ගේ ජීවිත නැවත කැප කරමින්, විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුවද ශුභාරංචි සේවය අඛණ්ඩව කරගෙන යාමට ධෛර්යය සහ බලය ලබා දෙන ලෙස ඉල්ලමින් ඔවුන් උදෙසා අප යාච්ඤා කළ යුතුය. ශුද්ධ වූ

සභාවට සේවය කිරීම සඳහා වැඩි වැඩියෙන් අපගේ දරුවන් සහ යෞවනයන් හට ඔවුන්ගේ ජීවිත කැප කරන්නට හැකියාව  ලබා දෙන ලෙස ද ඉල්ලා අපි යාච්ඤා කරමු. මතක තබා ගන්න, ශුද්ධ වූ සභාව යනු ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයයි, එනම් ලෝකය තුළ ජේසුස් වහන්සේගේ සැබෑ ව්‍යාප්තියයි.

**දන්දීම:** අපගේ දසයෙන් කොටස් සහ පඬුරු වලට අමතරව, අපගේ මූල්‍ය පරිත්‍යාග තුළින් ධර්මදූත මෙහෙවරට සහය වීමට ද අපට ඇරයුම් කර ඇත. පිලිප්පි 4:18 හි, ශුද්ධ වූ පාවුලු තුමන් අපට පවසන්නේ මෙම තෑගි 'දෙවියන් වහන්සේට ප්‍රසන්න වූ පිළිගත හැකි පූජාවක්' බවයි. එබැවින්, අපෝස්තුළුවරුන්ගේ චතාරිකය යනු ඇතැම් ආහාර වර්ගවලින් වැළකී උපවාස කිරීමෙන් අප ඉතිරිකරගන්නා මුදල වෙන් කර අපගේ සභාවේ මෙහෙවර කටයුතු උදෙසා වැය කිරීමට ලබා දිය හැකි සුදුසුම කාලයයි.

මාගේ ප්‍රේමණීය දරුවෙනි, සෑම විටම මෙන්, මෙම ශුද්ධ වූ දිනවලදී ද මම ඔබ සැම මාගේ යාච්ඤාවන්ට ඇතුළත් කර ගන්නෙමි. අපෝස්තුළුවරුන්ගේ ආදර්ශය අනුගමනය කරමින්, අපගේ පවුල්වලත්, අපගේ ප්‍රජාව තුළ සහ පොළොවේ සීමා කෙළවර දක්වා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශුභාරංචිය මගින් අපට පිරිනමනු ලබන ප්‍රීතිය සහ බලාපොරොත්තුව පිළිඹිබු කිරීමට අපගේ කැපවීම අලුත්කර ගනිමු. අපගේ උපවාසය, යාච්ඤාවට සහ ආහාරවලින් වැළකී සිටීමට පමණක් සීමා වුවහොත්, අපෝස්තුළුවරුන්ගේ චතාරිකයේ අරමුණ අපට මඟ හැරී යනු ඇත. එබැවින්, වචනයෙන් මෙන්ම, ක්‍රියාවෙන් ද අපෝස්තුළුවරුන් අනුගමනය කරමින් ඔවුන්ට ගෞරව

කිරීමට ස්වාමීන් වහන්සේගේ අනුග්‍රහය අපට ලබා දෙන සේක්වා. අපගේ දෙවි සමිඳාණන් වහන්සේගේ කැමැත්ත වටහා ගැනීමට ප්‍රඥාවත්, ඔවුන් වහන්සේගේ ආඥා වලට කීකරු වීමටත් ශක්තියත්, ඔවුන් වහන්සේගේ කරුණාව පිළිඹිබු කිරීමට ප්‍රේමයත් ලබා දෙන සේක්වා.

ශුද්ධ වූ ත්‍රිත්වය වන; පියාණන් වහන්සේගේ ද පුත්‍රයාණන් වහන්සේගේ ද ශුද්ධාත්මයාණන් වහනසේගේ ද අප්‍රමාණ අනුග්‍රහය සහ කරුණාව තුළින් අපට මඟ පෙන්වනු ලැබේවා. සියලුම ශාන්තුවරයන්ගේ සහ ශුද්ධ වූ තිඔටොකොස්ගේ මැදිහත්වීම සහ සහභාගීත්වය තුළින් දැනුත් සෑම වේලෙහිදීත් දෙවියන් වහන්සේගේ සිංහාසනය ඉදිරියේ අපට ආරක්ෂාව ලැබේවා - ආමෙන්. ✝

පීතෘ ප්‍රේමය සහ යාච්ඤාව සමගින්,
ක්‍රිස්තුන් වහන්සේ තුළ ඔබගේ පියාණන්,



✝මෝරන් මෝර් සාමුවෙල් තියෝපිලස්
මෙට්‍රොපොලිටන්

දිනය ඃ

2026 මැයි මස 05 වෙනි දින

ස්ථානයඃ
ලෝක සභා මූලස්ථානය.

---

**සැ.යුඃ කරුණාකර මෙම ලිපිය සියලුම ප්‍රාදේශීය භාෂාවන්ට පරිවර්තනය කර, විශ්වාසිකයින් දිරිගැන්වීම සඳහා සියලුම දේවස්ථාන වල කියවීමට කටයුතු කරන්න.**